# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,825 - 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2013.08.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1756 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1761 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහ නගර සභාව

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වැනි වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ග බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තයකට ගැනීමට පිළිවෙලින් 2006.09.25, (අනු අංක 01) 2008.07.03,(අනු අංක 02) 2002.11.29 (අනු අංක 3, 4. 5), 2008.12.02 (අනු අංක 6, 7), 2008.08.05, 2009.07.02 (අනු අංක 08,09)2009.11.03, (අනු අංක 10, 11), 2009.12.21, (අනු අංක 12) 2010.06.11(අනු අංක 13), 2010.07.06(අනු අංක 14), 2010.09.06 (අනු අංක 15), 2010.11.04 (අනු අංක 16), 2010.12.15 (අනු අංක 17),2011.07.04 (අනු අංක 18, 19), 2011.03.07(අනු අංක 20), 2011.08.01 (අනු අංක 21), 2011.12.21 (අනු අංක 22, 23), 2012.03.28, (අනු අංක 24), 2012.08.28 (අනු අංක 25,26), 2012.04.26 (අනු අංක 27), 2012.10.31 (අනු අංක 28. 29) හා 2013.02.27 (අනු අංක 30) දරන සභා සම්මුතීන් අනුව තීරණය කර ඇත.

2013 අප්‍රේල් මස 26 වැනි දින ගැසට් පත්‍රයේ පළ වූ පරිදි එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාරව විරෝධතාවයක් නොමැති හෙයින් මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ග බදුල්ල මහ නගර සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2013 ක් වූ අගෝස්තු මස 02 වැනි දින දීය.

### උපලේඛනය

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම් පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල නිව් ටුවරිස්ට් ඉන් හෝටලය අසළ අතුරු මාර්ගය | මහියංගන පාර | 120/12 | 120/6, 120/7, 120/8 120/10, 120/11 | 120/20, 120/19, 120/14, 120/40, 120/84, 192/30,192/34,120/24 192/57, 192/48, 192/47, 192/59,192/62, 192/64, 192/69, 192/70, 192/72, 192/78, 192/82 | 192/12= 200m 192= 140m | 4.5m |
| 02 | බදුල්ල බණ්ඩාරනායක මාවත ටාර්ගට්රේන්ජ් පාර | බණ්ඩාරනායක පාර | 34/4 | 54, 34/16, 43/15, 34/14 | 3A/36, 42/2, 42/1, 34/20, 34/19 34/18 | 290m | 170m= 6 m 170m- 290 m =4.5 m |
| 03 | ජල ටැංකිය පාර 5 වන පටුමඟ | ජලටැංකිය පාර | 40/7 | 40/2, 40/4, 40/6, 40/7, 40/8, 40/10 | - | 107.40 m | 4.4 m |
| 04 | හෙල මාවත අළුත් පාර තෙවන පටුමග | මයිලගස්තැන්න පාර | 9/3 | 15/5, 15/3 | 15/2,15/7,15/11 | 76.0m | 4.5m |
| 05 | පීනානන්ද ගම මාර්ගය | වරිපනම් අංක 14/19 | 13/19 15/19 | 10/19, 12/19, 14/19 15/19 | | 122 m | 3.0 m |
| 06 | පිලිපොතගම පළමු පටුමග | පිලිපොතගම පාර | 14/14 | 141/14, 141/12, 141/11, 141/8, 141/7 141/6, 141/4, 16/2, 16/1 | - | 157.0 m | 3.0 m |
| 07 | නඩුකාරකන්ද හිල්ලන්ද කෝපිවත්ත හරස් පටුමග | වරිපනම් අංක 65/1 | 65/33 | 65/1, 65/5, 65/17 65/21A, 65/21B, 65/23,65/33, 65/18A,, 65/20 | 65/2, 65/4A, 65/8, 65/15, 65/24, 65/32 | 257.0 m | 5.0 m |

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම් පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 08 | ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ දුනුකාරකුඹුර නමැති ඉඩමේ පොදු මාර්ගය | ස්ප්‍රිංවැලි පාර | 24/16A | 24/7, 24/9, 24/14, 24/15, 24/16A | 24/17, 24/20, 24/18 | 100.0 m | මුල් මීටර් 0.80-4.5 m ඉතිරි මීටර් 20-3.0 m |
| 09 | කුමාරසිංහ මාවතේ අතුරු මාර්ගය | කුමාරසිංහ මාවත | 66/6 | 74/23, 47/19, 66/05 | 66/09, 66/08, 66/06 | 80.0 m | මුල් මීටර් 0.70-4.5 m ඉතිරි මීටර් 10- 3.0 m |
| 10 | උදයගම පහලගම් කොටසට පිවිසුම් මඟ | හිඟුරුගමුව ප්‍රධාන පාර | 334/14 | 334/10,334/11, 334/12 334/14 | 334/19, 334/18, 334/15 | 185.0 m | 4.05 m |
| 11 | විද්‍යාල පටුමඟ අතුරු මාර්ගය | විද්‍යාල පටුමඟ | 52/7 | 52/2 1/1, 52/2, 52/4 | 52, 52/11, 52/10, 52/10A, 52/8 | 60.0 m | 3.9 m |
| 12 | බදුල්ල පහල ගම මැදපතන මාර්ගයේ ගොරකාවෙල දක්වා දිවෙන පටුමඟ | මැදපතන පාර | කේ. ඒ. කුසුමාවතීගේ ඉඩම | - | 110/1, 110 | 32.0m | 3.05 m |
| 13 | රත්වත්ත මාවත අතුරු මාර්ගය | රත්වත්ත මාවත | 29/17 | 29/7,29/8,29/9, 29/10,29/15,29/17 | 29/22, 29/29 | 200.0 m | 4.05 m |
| 14 | විජයාරාම පන්සලේ දකුණු පටුමඟ | මහියංගන පාර | 169/11 | 169/2A,169/4, 169/6,169/7,169/9 169/10,169/11 | - | 100.0 m | 4.05 m |
| 15 | හංවැල්ල උයන්වත්ත මාර්ගය | හංවැල්ල ප්‍රධාන පාර | 43/11B | 43/11B,11/16,22/1 37/19 | 37/18, 43/22, 43/17, 43/13A, 43/13, 43/12A, 43/11A | 200.0 m | 6.0 m |
| 16 | ආර්. එච්. ගුණවර්ධන මාවත අතුරු මාර්ගය | ආර්. එච්. ගුණවර්ධන මාවත | 24/15A | 24/10, 24/11, 24/11A, 24/13, 24/14A, 24/14, 20/21, 20/23, 24/15 | 24/16, 24/18, 24/17, 24/17A,20/26 | 105 m | 6.0 m |
| 17 | හෙළ මාවත ඉහළ කොටස | හෙළ මාවත | 60 | 49, 51, 49/1 | 56 | 75.0 m | 3.0 m |
| 18 | රේස්කෝස් පාර 1 වැනි පටුමඟ | රේස්කෝස් පාර | 96/3 | 90/2, 90/2/1/01 90/03, 90/02/1, 90/1A 96/3, 90/1 | | 100.0 m | 3.05 m |
| 19 | දෙයියන්නේවෙල ලියන්ගෝල්ල පාර | දෙයියන්නේවෙල පාර | 220/06 | 224, 224/1, 226 | 220/5, 220/6 | 3.00 m | 3.40 m |
| 20 | ළිඳමුල්ල වීර්යපුර පටුමඟ | ස්ප්‍රිංවැලි පාර | 19/28 | 169/1, 123/5, 19/28 | 169/17, 169/5, 19/19, 19/18 | 144.0m | ආරම්භය අඩි 09 අවසානය අඩි 11 |

| අනු අංකය | පාරේ නම | පටන් ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය වරිපනම් අංක | වම් පස වරිපනම් අංක | දකුණු පස වරිපනම් අංක | දිග මීටර් | පළල මීටර් |
|---|---|---|---|---|---|---|---|
| 21 | බදුළුපිටිය කාදර්මාවත 1 වැනි පටුමඟ | කාදර්මාවත | 9/4 | 9/3 | 9/9, 9/8, 9/7, 9/6, 9/5, 9/4 | 100.0 m | 3.05 m |
| 22 | ජම්බුගස් මාවත 2 වන පටුමඟ | ජම්බුගස් මාවත | 29/12 | 29/5, 29/2, 29/13, 29/12, 29/10, 26/14 | 29/18, 29/19, 29/20 | 65.0 m | 2.1 m |
| 23 | බදුළුපිටිය බන්ධනාගාර නිල නිවස අසල අතුරු මාර්ගය | බදුලුපිටිය ප්‍රධාන පාර | 37/4 | 65/1, 65/5, 65/4, 65/7, 65/9, 65/6 37/3 | 65/12/1, 37/4, 37, 45/7 | 134.0 m | 3-4 m අතර |
| 24 | උග්ගල්පොත්ත ගමට පිවිසුම් මඟ | අළුගොල්ල පටුමග | 11/14A | 35/6, 21/13A, 25/13/ 1U/10,/C/2003, 11/14A | 15, 25/4 | 110.0 m | 2.5 m |
| 25 | ගංගනි විලේජ් මාර්ගය | හම්බාවෙල මාර්ගය | 36/11 | 36/2, 36/4, 36/5 36/10, 36/11 | 36/24, 36/21, 36/16, 36/14, 36/18 | 155.0 m | 4.05 m |
| 26 | මැදපතන පරගහ ඇල්ල ගම පාර | මැදපතන වටරවුම් පාර | 83/9B | 83/17, 83/18, 83/16R, 83/3, 83/8 83/9B | 83/49, 83/46, 83/39, 183/37, 83/41 83/23B, 83/23C, 83/16, 83/9C | 355.0 m | 4.50 m |
| 27 | හිඟුරුගමුව මහගල්වත්ත පාර | හිඟුරුගමුව පාර | 147/9 | 147/3, 147/4, 145/5 146/7 | 147/9 | 100.0 m | ආරම්භක ස්ථාන යේ සිට 40 mක් දක්වා 2m ඊළඟ 30 m - 1.5 m ඊළඟ 30m - 2m |
| 28 | ගඟබඩ පාර 2 වැනි පටුමඟ | ගඟබඩ පාර | 6/16 | 6/1 | 6/12, 6/11, 6/12A, 6/14A, 6/13,10/2B, 6/16 | 155.0 m | 4.05 m |
| 29 | අස්වැද්දුම් පිටිය අතුරු මාර්ගය | හිඟුරුගමුව දුනුවංගිය පාර | 493/9 | 493/2, 493/3, 493/4 | 493/10, 493/8, 493/13 493/9 | 140.0 m | 3.00 m |
| 30 | සුවිනීතගම 1 වැනි පටුමග | මහියංගන පාර | විපුලසේන මහතාගේ ඉඩම | 371 | 379, 9/375, 8/375, 7/375 | 60 m | 3.05 |

08-704

---

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 69 සහ 126 වැනි වගන්තිවලින් 9 අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට බලය ඇති බැවින්, දකුණු පළාත්, පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමන් විසින් 2013 මැයි 17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV කොටසේ (පළාත් සභා) පිටු අංක 355 සිට 443 දක්වා පිටුවල පළ කරන ලද පහත උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථා සංශෝධන රහිතව කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට 2013 ජුනි මස 26 දින මහා සභා රැස්වීමේදී තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

1. සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
2. සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
3. කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
4. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
5. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
6. සිසිල්බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
7. කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන් හල් හා රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
8. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
9. කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
10. පිහිනුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථා
11. අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
12. බත්කඩ, ආපනශාලා, සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා
13. හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
14. නවාතැන් පොලවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
15. ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
16. කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
17. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
18. සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
19. පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
20. ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණ හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
21. වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
22. මාර්ග වලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
23. ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
24. පොදු වෙළඳපොල පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
25. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
26. ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා
27. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
28. උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
29. වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

ගාමිණී අමරවංශ මුණුගොඩ,
සභාපති,
කරන්දෙනිය ප්‍රාදේශීය සභාව.

08-661

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### සුසානභූමි හා මිනීපිටි ලියාපදිංචි කිරීම - 2013

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය සමග කියවිය යුතු 1899 අංක 09 දරන සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 5 වන වගන්තියේ (1) උප වගන්තිය ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. එච්. ටී. අයි. පී. ක්‍රිෂාලි වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් එකී ආඥා පනතේ කාර්යයන් සඳහා පොදු සුසාන භූමි විය යුතු යයි මෙයින් නියම කරමි.

#### උපලේඛනය

| *අනු අංකය* | *නම* | *පිහිටීම* | *වපසරිය (හෙක්ටයාර්)* |
|---|---|---|---|
| 01. | මහාපාදිලියාවත්ත සුසාන භූමිය | දික්වැල්ල නගරය මහවෙල පාර | 0.43428 |
| 02. | මැල්පුර සුසාන භූමිය | මැල්පුර, වලස්ගල | 0.1886 |
| 03. | පුබුදුගම සුසාන භූමිය | පුබුදුගම, රත්මලේ | 0.1945 |

ක්‍රිෂාලි මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2013 ජුනි මස 19 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව (2013.02.22 දින පැවති මහා සභාවේ අංක 6:1:4 යටතේ යෝජනා ස්ථිර විය)*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව හා සුසාන භූමි හා මිනීපිටි ආඥාපනතේ විධිවිධානවලට අනුව දික්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි මහාපාදිලියාවත්ත සුසාන භූමිය, මැල්පුර සුසාන භූමිය හා රත්මලේ පුබුදුගම සුසාන භූමිය දැනටමත් ජනතාව දීර්ඝ කාලයක සිට සුසාන භූමි ලෙස භාවිතා කරන අතර මේ සුසාන භූමි සභාවේ ලියාපදිංචි කර රජයේ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර විධිමත්ව පවත්වාගෙන යා යුතු යැයි යෝජනා කරමි.

08-672

---

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

වාහන නතර කර තැබීම තහනම් කිරීම සඳහා කරනු ලබන නිවේදනයයි

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2013 ජූලි මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී යෝජනා අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 111 වන කොටසේ 34 වගන්තිය යටතේ හා එකී සභාව විසින් වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථාව අනුව කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කඹුරුපිටිය නගරයේ වටරවුම අසල සිට සමුපකාර තෙල් පිරවුම්හල දක්වා ප්‍රධාන මාර්ගයෙන් 2013 සැප්තැම්බර් 01 දින සිට පෙ.ව. 7.00 සිට 8.00 දක්වා ද, පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ද වන කාලය තුළ මාර්ගය දෙපස වාහන නතර කර තැබීම තහනම් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන සිරිබද්දන,
සභාපති,
කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව.

2013 ක් වූ අගෝස්තු මස 05 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී

08-745

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංවාවත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට මහ නගර සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් විරුද්ධතාවයක් පලකරන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත එකී විරෝධතාවයන් ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් සීමාව සිට - දක්වා* | *දිග අඩි* | *පළල අඩි* |
|---|---|---|---|---|
| 01 | දේවාල පාර, අංක 40 වත්තට තිබෙන මාර්ගය | ව.අ. 40, 40/2, 40/3, 40/7,40/7ඒ, 40/9 සිට 40/12 ඒ දක්වා සහ 40/18, 40/20 | 85 | අඩි 10 සිට 15 දක්වා |

08-780

**බදුල්ල මහ නගර සභාව**

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනතේ 48(1) වගන්ති ප්‍රකාරව ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහ නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2013.06.28 දින දරන සභා සම්මුතින් අනුව තීරණය කර ඇත.

ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මෙම මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30ක් තුල දී තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව මහ නගර සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාල සීමාව තුල දැනුම් දීම ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහ නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

උපාලි නිශ්ශංක ගුණසේකර,
නගරාධිපති,
මහ නගර සභාව,
බදුල්ල.

2013 ක් වූ අගෝස්තු මස 02 වැනි දින,
මහ නගර සභාව,
බදුල්ල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය වරිපනම් අංක* | *වම් පස වරිපනම් අංක* | *දකුණු පස වරිපනම් අංක* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 01 | කැප්පෙටිපොළ මාර්ගයේ හයස්ටඩ් අධ්‍යාපන ආයතනය ඉදිරිපිට අතුරු මාර්ගය | කැප්පෙටිපොළ පාර | 211/4 | 211/3,211/2,211/2A | 211/8,,211/6,,211/4 | 138 | ආරම්භක පළල 4.42 අවසාන පළල 3.00 |

08-703

# විවිධ දැන්වීම්

**කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

2013 වර්ෂයට සේවා සැපයීමේ දී අයකරනු ලබන ගාස්තු සංශෝධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තියේ (ආ) උපවගන්තිය ප්‍රකාර කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 2013 වර්ෂයෙහි ජූලි 26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2013 වර්ෂයෙහි ජූලි 26 වැනි දින,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව,
ගොතටුව නව නගරය.

මෙම නිවේදනය 2013.05.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසෙහි විවිධ දැන්වීම් යටතේ පළකරන ලද දැන්වීමෙහි සඳහන් ගලි බවුසර් රථයේ සේවය ලබාදීමේ දී අය කෙරෙන ගාස්තු සංශෝධනයක් වශයෙන් පළකරන ලදී.

**යෝජනාව**

කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2013 වර්ෂයේ අගෝස්තු 01 වැනි දින සිට 2013 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන බව දැනුම් දෙමි.

**ඉහත කී උපලේඛනය**

1. ලීටර් 3,500 ගලි බවුසරයේ සේවාව සැපයීම බල ප්‍රදේශය ඇතුලත (එක් ගමන් වාරයකට)

| | පැරණි ගාස්තුව රු. | සංශෝධිත නව ගාස්තුව රු. |
|---|---|---|
| *(අ)* නේවාසික ස්ථාන | 3,500 | 2,500 |
| *(ආ)* ව්‍යාපාරික ස්ථාන හෝ රාජ්‍ය ආයතන | 4,500 | 3,000 |

*(ඇ)* ගලි- බවුසර් සේවාව සැපයීම සඳහා යම් ස්ථානයකට ගමන් කිරීමෙන් පසුව යම් හෙයකින් සේවාව සැපයීමට නොහැකි වුවහොත්, අයකරන ලද ගාස්තුවෙන් රු. 1,050 ක් සභාවට අය කරගෙන ඉතිරිය ආපසු ගෙවනු ලැබේ.

2 ලීටර් 3,500 ගලි බවුසරයේ සේවාව සැපයීම බල ප්‍රදේශය පිටත (එක් ගමන් වාරයකට)

| | පැරණි ගාස්තුව රු. | සංශෝධිත නව ගාස්තුව රු. |
|---|---|---|
| *(අ)* නේවාසික ස්ථාන | 4,000 | 3,000 |
| *(ආ)* ව්‍යාපාරික ස්ථාන හෝ රාජ්‍ය ආයතන | 5,000 | 3,500 |

*(ඇ)* ගලි-බවුසර් සේවාව සැපයීම සඳහා යම් ස්ථානයකට ගමන් කිරීමෙන් පසුව යම් හෙයකින් සේවාව සැපයීමට නොහැකි වුවහොත්, අය කරන ලද ගාස්තුවෙන් රු. 1,200 ක් සභාවට අය කරගෙන ඉතිරිය ආපසු ගෙවනු ලැබේ.

ඉහත ගාස්තුවලට අමතරව ජාතිය ගොඩනැගීමේ බදු මුදල් හා එකතු කළ අගය මත බදු මුදල් ගෙවිය යුතුයි.

08-762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.